# සතුරෝ හා මිතුරෝ

පසුගිය දින කිහිපයෙහි සිදුවූ සිදුවීම්වලින් අපේ මිතුරන් හා සතුරන් කිහිප දෙනකු මෙන්ම මිතුරන් වෙසින් පෙනී සිට අපට විනකරන්නවුන්ගෙන් ඇතැමුන් ද නැවතත් හඳුනා ගැනීමේ අවස්ථාව උදාවිය. ඒ එක් අතකින් ගත් කල අප දැන සිටි දේ තහවුරු කිරීමක් විය. සිරස යනු සිංහල සංස්කෘතියට හා සිංහල ජාතියට විරුද්ධ ජඩමාධ්‍යයක් බව අප කීවේ අද ඊයේ නොවෙයි. ඉන්දියාවේ දෙපා රුවාගෙන ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යන්නන්ට සිංහල ජාතිය ගැන කැක්කුමක් ඇතිවිය නොහැකිය. ඇතැම් පණ්ඩිතයකු ජාතිය යනුවෙන් දෙයක් තිබේදැයි ඇසීමට ඉඩ ඇත. බටහිර විද්‍යාවේ ඇතැයි කියන සත්‍යය හා එහි විස්කම් ගැන නිතර කතාකරන කාලෝ ෆොන්සේකා මහතා බොහෝ කලකට පෙර පණ්ඩිතමානීව පැවසුවේ ලේ මගින් ජාතිය නිර්ණය නොකළ හැකි බවය. ඔහු ඒ උදාහරණය ගෙන ආවේ බටහිර ජීව විද්‍යාවට ජාතිය යනු කුමක්දැයි දැන ගැනීමට නිර්වචනයක් නැති බව කීමටත් එබැවින් ජාතියක් යනුවෙන් දෙයක් නැතැයි කීමටත්ය. ඒ දිනවලම එයට නිසි පිළිතුරු ලබාදීමෙන් පසු ඒ මහතා නිහඬ විය. එහෙත් ඒ මහතා තවමත් ඒ මතය දරන්නේදැයි නොදන්නෙමි.

බටහිර භෞතික විද්‍යාවට ගොනකු හා බූරුවකු අතර වෙනස නොකිව හැකිය. එහෙත් එපමණකින් ගොනුන් හා බූරුවන් නැතැයි කියන ගොනකු හෝ බූරුවකු හෝ ඇතැයි සිතිය නොහැකිය. ජීව විද්‍යාවට ජාතිය යන්න හසුනොවන පමණින් ජාතිය යනුවෙන් දෙයක් නැතැයි කිව නොහැකිය. ජාතිය යන්න ගැන කතා කළ යුත්තේ වෙනත් ක්ෂේත්‍රයක ය. ඒ කෙසේ වෙතත් අපට අවශ්‍ය වන්නේ සිරස ජඩමාධ්‍යය සිංහල ජාතියේ පැවැත්මට එරෙහිව කටයුතු කරන බව නැවත වතාවක් තහවුරු කරන සිද්ධියක් ගැන කරුණක් දෙකක් සඳහන් කිරීම ය. පසුගියදා පාසල් සිසුන් ඉගෙන ගනිමින් සිටි පාසලකට ආණ්ඩුවේ හමුදා බෝම්බ හෙළී යැයි කොටි තම වෙබ් අඩවිය ඔස්සේ ප්‍රචාරය කළේය. ඒ කරුණු විකෘති කිරීමක් විය. හමුදාව කොටි ත්‍රස්තවාදීන් පුහුණුකරන ආයතනයකට නම් පහරදී තිබිණි. කොටින්ට පක්ෂපාතී බොරු බෙගල් ප්‍රචාරය කරන ආයතනයක් වූ බීබීසී ය පවා ඒ ප්‍රවෘත්තිය ප්‍රචාරය කර තිබුණේ හමුදාව පාසලකට බෝම්බ දමා ඇතැයි කොටි ප්‍රකාශ කරන බව කියමිනි. එහෙත් සිරසට එය තමන් හොඳින් දත් ප්‍රවෘත්තියක් විය. ඔවුන් ඒ ප්‍රචාරය කළේ තමන් පරීක්ෂා කර දැනගත් ප්‍රවෘත්තියක් ලෙස ය. මේ ජඩමාධ්‍යවේදීන් හා මහාරාජා සමාගම සේවය කරන්නේ කාහටදැයි තේරුම් ගැනීම අපහසුවක් නොවෙයි.

එක්සත් ජාතික පක්ෂය ප්‍රකාශයක් කරමින් ඊනියා පාසලට බෝම්බ දැමීමේ සිද්ධිය පිළිබඳ පරීක්ෂණයක් ඉල්ලා ඇත. එවැනි පරීක්ෂණයක් ඉල්ලීමෙන් ඒ පක්ෂය කොටින්ට සේවය කරයි. අද රනිල් වික්‍රමසිංහගේ නායකත්වය යටතේ එජාප ක්‍රියාකරන්නේ කොටි ප්‍රකාශකයකු ලෙසය. රටේ ප්‍රධානතම විරුද්ධ පක්ෂය ලෙස ඒ පක්ෂයට ඇති වැදගත්කම යොදා ගනිමින් රනිල් වික්‍රමසිංහ තම බටහිර ක්‍රිස්තියානි හාම්පුතුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සිංහලයන්ට හා රාජ්‍යයට විරුද්ධව ඒ පක්ෂය මෙහෙයවයි. මැතිවරණ හා ජනාධිපතිවරණ දහහතරකින් පැරදීමෙන් පසුව ද රනිල් වික්‍රමසිංහ නායකත්වයෙන් නෙරපීමට එජා පාක්ෂිකයන්ට නොහැකි වී ඇත්තේ ඒ පක්ෂයේ බටහිර ගැති ප්‍රතිපත්ති හේතුකොටගෙනය. බටහිරයෝ රනිල් වික්‍රමසිංහ නායකත්වයෙහි තබා ගැනීමට අවශ්‍ය සියලු ආධාර දෙති. ප්‍රධාන වශයෙන්ම බටහිර අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින එජා පක්ෂයට බටහිරයන්ගේ ආධාරය නොමැතිව පැවැත්මක් නැත. ජාතිකත්වයට පක්ෂ කිසිවකුට අද ඒ පක්ෂයේ තවදුරටත් රැඳී සිටිය නොහැකි තත්ත්වයක් උදාවී ඇත.

මේ අතර ඉන්දියාව ලංකාවට ආයුධ නොවිකිණීමට තීරණය කර ඇත. ඉතා පැහැදිලිවම ඉන්දියාව කොටින්ට වක්‍රව සහාය දෙන ප්‍රතපත්තියක් අනුගමනය කරයි. කොටි රජිව් ගාන්ධි මහතා මරණයට පත් කළද සෝනියා ගාන්ධි මහත්මියගේ නායකත්වය යටතේ අද ඉන්දීය රජයත් කොංග්‍රස් පක්ෂයත් කොටින්ට පක්ෂපාතී ප්‍රතිපත්තියක පිහිටයි. ඔවුන්ට ඒ බව ප්‍රසිද්ධියේම කීමට අපහසුතාවක් ඇත්තේ ඉන්දීය මහජනතාවගෙන් ඉතා විශාල ප්‍රමාණයක් කොටි විරෝධී බැවිනි. අප කලින් සඳහන් කර ඇති ආකාරයට අද ඉන්දියාව දෙවැනි වෛදිකකරණයට හෙවත් ආර්යකරණයකට භාජනය වී ඇත. අවුරුදු තුන්දහසකට පමණ පෙර බටහිරින් භාරතයට පැමිණි ආර්යයෝ භාරතයෙහි සංස්කෘතිය වෙනස් කර වෛදික සංස්කෘතියක් ඇති කළහ. ලෞකික වශයෙන් ගත් කල බුද්ධදහම ද ජෛන දහම ද ඒ වෛදික සංස්කෘතියට එරෙහිව පැනනැගුණු දේශජ ප්‍රතිචාරවල ප්‍රතිඵල විය. එහි ප්‍රතිඵලය වූයේ තවත් සියවස් ගණනක් ඇවෑමෙන් සතුන් බිලිදෙන යාගහෝමවලට මුල්තැන් දුන් වෛදික සංස්කෘතිය බෞද්ධ හා ජෛන සංස්කෘතීන් අවශෝෂණය කරමින් අහිංසාවට ගරුකරන හින්දු ආගම හා හින්දු සංස්කෘතිය නිර්මාණය

© Prof. Nalin De Silva

කිරීමය. හින්දු ආගම සිදුහත් කුමරුන්ගේ කාලයේ සිට භාරතයේ පවතින්නක් නොව ශංකරාචාර්යවරයාගේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස හයවැනි සියවසෙන් පසුව බිහිවූවකි.

අද නැවතත් බටහිරයන්ගේ සංස්කෘතික ආක්‍රමණයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාව දෙවැනි වෛදිකකරණයකට භාජනය වෙමින් පවතියි. සාරියක් පොරවාගත්තද සෝනියා ගාන්ධි මහත්මිය කතෝලික ආගම ඇදහූ ඉතාලි ජාතික කාන්තාවක් බව අමතක නොකළ යුතුය. අප රටේද බණ්ඩාරනායක පවුලේ ස්ත්‍රීන් විවාහ වූයේ කා සමගද යන්න මතක් කර ගැනීම ද මෙහිදී වැඩදායක වෙයි. ඉන්දියාවේ දෙවැනි වෛදිකකරණයත් සමග එරට මේ කලාපයේ බටහිර නියෝජිතයා බවට පත්වෙමින් ඇත. මෙහිදී ඉන්දියාවේ ප්‍රධානම ඉලක්කයක් වන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය බව පැහැදිලිය. අවුරුදු දහස් ගණනක් තිස්සේ භාරතීය බලපෑම් මධ්‍යයෙහි වෛදිකකරණයට විරුද්ධව සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට අපි සමත්වීමු. ඉන්දියාවට ඒ බව අමතක වී ඇතැයි සිතිය නොහැකිය. දේශපාලන වශයෙන් දකුණු ඉන්දීය බලපෑම්වලට අප භාජනයවූ නමුත් අපේ සංස්කෘතික කලාපය වූයේ අද අග්නිදිග ආසියාව නමින් හැඳින්වෙන ප්‍රදේශය ය. මියන්මාරයේ සිට වියට්නාමය දක්වා අපි සම්බන්ධකම් පැවැත්වීමු. ලෝක එනම් එකල සංදර්භය තුළ ථෙරවාද බුද්ධගමෙහි මධ්‍යස්ථානය වූයේ ලංකාවය. අද අපි මේ සම්බන්ධකම් අමතකර ඇත්තෙමු. අපේ දුර්වලකම හේතුකොටගෙන අද කොටි අවි ආයුධ ලබාගැනීමට යොදාගන්නේ තායිලන්තය :සියම) කම්පුචියාව :කාම්බෝජය) වැනි ථෙරවාද බෞද්ධ රටවල්ය. තායිලන්තයේ අපේ තානාපතිවරයකු සිටියද, කාම්බෝජය සමග අපට තානාපති සම්බන්ධකම් ද නැත. අනෙක් අතට අපේ තානාපති සම්බන්ධකම් ගොඩනැගී ඇත්තේ විකෘති බටහිර ආකෘතියකය. අද අප තානාපතිවරුන් පත්කරන්නේ රටේ අවශ්‍යතා වෙනුවෙන් නොව පුද්ගලයන්ට දෙන දේශපාලන හෝ පෞද්ගලික ත්‍යාග පදනමකින්ය.

ඉන්දියාව අපට ආයුධ නොවිකුණන්නේ හින්දු අහිංසාවක් පදනම් කර ගනිමින් හෝ මෙරට රාජ්‍ය නොවන සංවිධානවල බැල මෙහෙකම් කරන පුද්ගලයන්ගේ ඊනියා සාමයික අවශ්‍යතාවක් නිසා හෝ නොවන බව තේරුම් ගත නොහැකි අයකු වෙතොත් ඒ ඊනියා ප්‍රබුද්ධයකුම විය යුතු යැයි සිතමි. ඉන්දියාව එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරද්දී පකිස්තානය අපට ආයුධ විකුණනවා පමණක් නොව ඒකීය ලංකාවක් වෙනුවෙන් ද පෙනී සිටියි. ඇතැම්විට ඒකීය ලංකාවක් වෙනුවෙන් පෙනී සිටින එකම විදේශික රාජ්‍යය පකිස්ථානය විය හැකි ය. අප අපේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් නිසි ලෙස යොදාගන්නේ නම් චීනය හා ථෙරවාදී කලාපයේ රටවල් ද ඒකීය ලංකාවක් වෙනුවෙන් පෙනී සිටින රාජ්‍ය බවට පත්කර ගත හැකිය. ථෙරවාද කලාපයේ රටවල් එක්සේසත් රාජ්‍ය යන සංකල්පය දැන හැඳිනගත්තේ බටහිරයන් ඒකීය රාජ්‍ය හෝ ඊනියා ජාතික රාජ්‍ය ගැන හැඳින ගැනීමට සියවස් ගණනාවකට පෙර බව දරුණු හීනමානයෙන් පෙළෙන එච්.එල්. සෙනෙවිරත්න නම් ඇමරිකාවට සේවය කරන සමාජ විද්‍යා මහාචාර්යවරයා හා අනෙක් ඊනියා ප්‍රබුද්ධයන් නොදන්නවා විය හැකිය. එපමණක් නොව ඒ සංකල්පය ඒ රටවලට ලැබෙන්නට ඇත්තේ මෙරටින් වීමටද ඇති ඉඩකඩ ඉතා අධිකය. අපේ එක්සේසත් රාජ්‍යය රැක ගැනීමට අපට බාධා කරන්නේ බටහිරයන් හා ඔවුන්ගේ විවිධ නියෝජිතයන්ය.

ලංකාවේ පකිස්තාන තානාපතිවරයා ඝාතනය කිරීමට කොටි උත්සාහ ගත්තේ එවැනි පසුබිමකය. අද පකිස්ථානය පමා වී හෝ ඇමරිකාවට අවශ්‍ය වන්නේ ඉන්දියාව මිස එරට නොවන බව අවබෝධකර ගනිමින් සිටියි. ඇමරිකන් රාජ්‍ය නිලධාරීන් ඉන්දියාවේ දින කිහිපයක් ගතකර ආපසු යන ගමනේ පකිස්ථානයෙහි පැය කිහිපයක් ගත කරන්නේ තමන් රැවටීමට බව අවබෝධ කර ගැනීම පකිස්ථානයට ප්‍රශ්නයක් වේ යැයි සිතිය නොහැකිය. ථෙරවාදයෙහි මධ්‍යස්ථානය ලෙස අද අප එක්පැත්තකින් කළ යුත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ගැති නොවන සියලු රටවල් එකතු කිරීමය. සෝවියට් දේශයේ පැවති කාලයෙහි තිබූ නොබැඳි රාජ්‍ය සමුළුවට අද පැවැත්මක් නැත. ඒ වෙනුවට අද ඉඩක් ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යටත්විජිතවාදයට විරුද්ධ හා බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ගැති නොවන රටවල්වල සමුළුවකටය. අප ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව සතුටු කිරීමට තැත් කිරීම මුග්ධ ක්‍රියාවකි. අපට කිසි දිනෙක ඔවුන් සතුටු කිරීමට නොහැකිය. ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව පැත්තකට විසිකර අප ඉතා ඉක්මනින් අපේ මිතුරන් හඳුනා ගැනීමට හා එකතු කර ගැනීමට උත්සාහගත යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva